**<u>බන්ධනාගාර දෙපාර්තමේන්තු ප්‍රාථමික ශිල්පී සේවා ගණය සඳහා (111 වන පන්තිය)</u>**
**<u>ඡායා රූප ශිල්පී හා සංස්කරණ ශිල්පී තනතුරු සඳහා බඳවා ගැනීම.</u>**

ශ්‍රී ලංකා බන්ධනාගර දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය සේවා ගණය සඳහා පහත තනතුරු පුරප්පාඩු වී ඇති බැවින් ඒ සඳහා සුදුස්සන් තෝරා ගැනීමට පහත සඳහන් සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පිරිමි පුරවැසියන්ගේ අයදුම්පත් කැඳවනු ලැබේ.

**01.<u>තනතුරු:- ඡායා රූප ශිල්පී හා සංස්කරණ ශිල්පී තනතුරු 111වන පන්තිය</u>**

| **අනු අංකය** | **තනතුර** | **පුරප්පාඩු ගණන** |
|---|---|---|
| **01** | ඡායා රූප ශිල්පී | 01 |
| **02** | සංස්කරණ ශිල්පී | 01 |

**02.** **වැටුප් ක්‍රමය :-**

රු.25,790 - 10 x270 - 10 x 300 - 10 x 330 - 12x350 - රු.38,990 ( PL 3 – 03/2016)

2016.02.25 දිනැතිරාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි උප ලේඛන 11 අනුව වැටුප් ගෙවනු ලැබේ.

**3.** **අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :-**

**(අ)** **අධ්‍යාපන සුදුසුකම්** :

අ.පො.ස.(සා/පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදීයටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් 06 කින් සමත් වී තිබිය යුතුය.

**(ආ)වෘත්තිය සුදුසුකම්**:

එක් එක් ක්ෂේත්‍රයේ හි කාර්ය භාවිතයට අදාලව තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගනු ලබන ජාතිකවෘත්තිය කුසලතාවන් හි(NVQ) සිව්වැනි (04)මට්ටමට ඇතුළත් වන්නා වූ අදාළ තාක්ෂණික පාඨමාලාවන් සාර්ථකව හදාරා තිබිය යුතුය.(සහතික මගින් සනාථ කල යුතුය)

**(ඇ)පළපුරුද්ද**:

අදාළ කේෂ්ත්‍රයේ ලබා ඇති පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.
(සහතික මගින් සනාථ කල යුතුය

**(ඈ)** **වයස් සීමාව** :

ගැසට් නිවේදනය අනුව අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු දහ අට (18) ට නොඅඩු සහ අවුරුදු හතලිස් පහ (45) ට නොවැඩි පිරිමි අයදුම්කරුවන් විය යුතු ය.

**(ඉ)** **කායික සුදුසුකම්** :

අයදුම්කරුවන් -

(i)උස - අවම උස අඩි පහ (05) යි අඟල් හතර (04) ක් විය යුතු ය.

**(ඊ)** **වෙනත් සුදුසුකම්** :

(i) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
(ii) මනා සෞඛ්‍යයකින් යුක්ත විය යුතු අතර, යහපත් චරිතයකින් ද යුක්ත අයවලුන් විය යුතුය.
(iii) චරිත දූෂණයට අදාළ වරදක් සම්බන්ධයෙන් ඕනෑම අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබීම තනතුරට පත්වීම සඳහා සම්පූර්ණ නුසුදුසුකමක් වන්නේය.
(iv) තනතුරට බඳවා ගැනීම සඳහා ඉහත (අ) සිට (ඊ) දක්වා වන සුදුසුකම් අයදුම්පත් කැඳවනු ලබන අවසන් දිනය වන
විට සෑම අයුරකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

## 4.බඳවා ගැනිමේ ක්‍රමය:-

ඉහත සුදුසුකම් ලත් අයදුම් කරුවන්යෝග්‍යතාව ඇගයීමේ වෘත්තියපරික්ෂණයකට යොමු කර ලබා ගන්නා ලකුණු කුසලතාව අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් සුදුසුකම් ලත් අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරික්ෂණයට සඳහාකැඳවනු ලැබේ.

## 5.විෂය නිර්දේශය -

- අදාල එක් එක් වෘත්තිය පිළිබඳ දැනුම හා හැකියාව මැනීම සඳහා නියමිත කාලයක් තුළදී නිම කළ යුතු වෘත්තියට අදාල කාර්යයන් පැවරීම

වෘත්තිය පරික්ෂණය

| පරික්ෂණයේදී ලකුණු ලබා දෙනු ලබන ශිර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| (අ) ඡායාරූප ශිල්පි<br>• කැමරාවක් ක්‍රියා කරවීම හා රූපගත කිරිම<br>• ආලෝකය සැපයිම හා නවීන තාක්ෂණික ක්‍රම භාවිතා කිරිම<br>• පැහැදිලි ඡායාරූප ගැනීම | 60<br>20<br>20<br>100 | 40% |
| **(ආ) සංස්කරණ ශිල්පි**<br>• සංස්කරණ ශිල්පි තනතුරට අදාළ තාක්ෂණික ක්‍රම භාවිතයෙන් සංස්කරණය කිරිම හා උපදෙස් භාවිතය | 100 | 40% |

**(මෙම වෘත්තිය පරික්ෂණය රජය පිළිගත් ආයතනයක් මඟින් පවත්වනු ලැබේ.)**

ව්‍යුහගත සම්මුඛ පරික්ෂණය (ඡායා රූප ශිල්පි)

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධන ශිර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තොරාගනු /ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අමතර අධ්‍යාපන සුදුසුකම් | 35 | 40% |
| අමතර වෘත්තිය සුදුසුකම් | 15 | |
| සේවා පළපුරුද්ද | 20 | |
| ඉංග්‍රීසි භාෂා ප්‍රවිනතාව | 10 | |
| පරිගණක දැනුම | 15 | |
| සම්මුඛ පරික්ෂනයේදී දක්වන ලද කුසලතාව | 05 | |

ව්‍යුහගත සම්මුඛ පරික්ෂණය (සංස්කරණ ශිල්පි)

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධන ශිර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තොරාගනු /ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අමතර අධ්‍යාපන සුදුසුකම් | 35 | 40% |
| අමතර වෘත්තිය සුදුසුකම් | 15 | |
| සේවා පළපුරුද්ද | 20 | |
| භාෂා ප්‍රවිනතාව | 10 | |
| පරිගණක දැනුම | 15 | |
| සම්මුඛ පරික්ෂනයේදී දක්වන ලද කුසලතාව | 05 | |

- ඉහත වගුවේ දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන්කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත්, යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරික්ෂණය සඳහා වන විස්තරාත්මක ලකුණු පරිපාටිය සම්මුඛ පරික්ෂණය සඳහා කැඳවීම් ලිපිය සමඟ යොමු කරණු ලැබේ.

## 7.සේවා කොන්දේසි

මෙම තනතුර ස්ථිර විශ්‍රාම වැටුප් ක්‍රමය පිලිබඳව රජය විසින් ඉදිරියේ දි ගනු ලබන ප්‍රතිපත්තිමය තිරණයන්ට අනුව සිදුවන අතර, වැන්දඹු භාඅනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් අය කර ගනු ලැබේ. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 69 - 82 දක්වා වගන්ති අදාලය.

**<u>සැලකිය යුතුයි.</u>**

ඉල්ලුම් පත්‍රය පිරවීමේදි ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. සුදුසුකම් පරීක්ෂා කිරීමේදී යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවක ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කල හැකිය. අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරනු ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් ඔහු රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන. **අයදුම්පත් කැඳවන අවස්ථාව වන විට ඉහත සඳහන් සුදුසුකම් සියල්ල සපුරා තිබිය යුතුය.**

නියමිත ආදර්ශ ආකෘතියට අනුකූලව අයදුම්පත්‍රය ඉදිරිපත් කල යුතුය. ඊට අනුකූල නොවන හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරවප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන්විසින් දරාගත යුතුය.

අයදුම්පත්‍රය බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ "**<u>ප්‍රාථමික ශිල්පී සේවා ගණය (111 වන පන්තිය)</u>**තනතුරු සඳහා බඳවා ගැනීම." යන්න සඳහන් කර, 2019.03.21 දින හෝ ඊට ප්‍රථම " බන්ධනාගාර කොමසාරිස් ජනරාල්,බන්ධනාගාර මූලස්ථානය, නො:150, බේස්ලයින් පාර, කොළඹ 09." යන ලිපිනය වෙත ලියාපදිංචිතැපෑලෙන් යොමු කල යුතුය.

එච්.එම්.එන්.සී.ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.

2019.02.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**<u>බන්ධනාගාර දෙපාර්තමේන්තුප්‍රාථමික ශිල්පි සේවා ගණය සඳහා (111 වන පන්තිය)</u>**

**<u>ජායා රූප ශිල්පි හා සංස්කරණ ශිල්පි තනතුරු සඳහා බඳවා ගැනීම.</u>**

| තනතුර | අයදුම් කරන තනතුර |
|---|---|
| ජායා රූප ශිල්පි | |
| සංස්කරණ ශිල්පි | |

**(අයදුම් කරන තනතුරට ඉදිරියෙන් √ ලකුණ යොදන්න)**

01. මුලකුරු සමඟ නම- ............................................................................................................................

02. මුලකුරු වලින් හැඳින්වෙන නම- ............................................................................................................

03. ස්ථිර ලිපිනය -.......................................................................................................................................

04. පදිංචි ලිපිනය අයත්වන

i.දිස්ත්‍රික්කය -............................................... ii. පොලිස් ස්ථානය -.............................................

05. දුරකථන අංකය ස්ථාවර -............................................ ජංගම -.......................................................

06. ජාතික හැඳුනුම්පත් අංකය

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

07. උපන් දිනය -වර්ෂය [ ][ ][ ][ ] මාසය [ ][ ] දිනය [ ][ ]

08. අයදුම්පත් කැඳවන අවසන් දිනට වයස (2019.03.21) - අවු .......... මාස......... දින........

09. පුරවැසිභාවය -..............................................................

(පරම්පරාවෙක්ද, ලියාපදිංචියෙන්ද යන වග)

10. විවාහක / අවිවාහක බව -.....................................................

11. සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින මාධ්‍යය -.................................................

12.අධ්‍යාපන සුදුසුකම් (පැහැදිලිව දැක්විය යුතුය) -අ.පො.ස (සා.පෙළ)

විභාගය: වර්ෂය: විභාග අංකය

1වාරය............................ ......................................... .........................................

2 වාරය............................ ......................................... ..........................................

| විෂය | ශ්‍රේණිය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

| විෂය | ශ්‍රේණිය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

13.වෘත්තිය සුදුසුකම් -
.....................................................................................................................................................................
.....................................................................................................................................................................
.....................................................................................................................................................................

14. ඉල්ලුම්කරු දැනට රැකියාවක නියුක්ත නම්
i.පදවිය -..............................................................................
ii.සේවය කරන ස්ථානය -..............................................................................
iii. පත්වීම් දිනය -..............................................................................

15. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියෙන් වරදකරු කරනු ලැබ තිබේද?
ඔව්/නැත (ඔව් නම් විස්තර සඳහන් කරන්න.)

16. අයදුම්කරුගේ සහතිකය:
මෙහි සඳහන් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, මෙහි ඇතුලත් තොරතුරු වලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මගේ අයදුම්පත අවලංගු වීමට යටත් වන බවත්, තෝරා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත්,කිසිම වන්දියක් නොමැතිව සේවයෙන් පහකිරීමට එකඟ වන බවත් මම මෙයින් ප්‍රකාශ කරමි.

දිනය :........................................ ................................................
අයදුම්කරුගේ අත්සන.

17. රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා පමණි.

මෙම අයදුම් පත්‍රය ඉදිරිපත් කරන..............................................................................මයා................................දින සිට..................................................අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ.............................................වශයෙන් ස්ථිර/තාවකාලික/අනියම් වශයෙන් නියුක්ත බවද, ඔහුගේ වැඩ හා හැසිරීම සතුටුදායක බවද,තනතුර සඳහා තෝරා ගතහොත් දැනට දරන තනතුරෙන් ඔහු නිදහස් කළ හැකි/නොහැකි බවද ප්‍රකාශ කරමි.

.......................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

දිනය:...................................